**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය 2013**

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ **2013** දෙසැම්බර් **31** දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 01 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(I) සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2014 මැයි 19 දින නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි

හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවධානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවධානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාව 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

කළමනාකරණ මණ්ඩලයේ තීරණය පරිදි පාඨමාලා ගාස්තුවෙන් ආයතන සංවර්ධන අරමුදලට නියමිත පරිදි රු.618,288 ක් මාරුකර ඇතත් එයට අතිරේකව ලැබිය යුතු හා ගෙවිය යුතු මුදලක් ලෙස නැවත ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් හා ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

2.2 නීති, රිති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති , රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 756, 757 සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ආයතන සංග්‍රහයේ xxvi පරිච්ඡේදය 2.12 වගන්තිය. | වාර්ෂිකව තොග සමීක්ෂණය සිදු කල යුතු වුවත් ආයතනයේ රසායනික තොග සමීක්ෂණය සිදු කර නොතිබුණි |
| (ආ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ආයතනය විසින් චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | 2004 ජනවාරි 26 දිනැති අංක 2004/පුස/1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවාමණ්ඩලයේ උපදේශණ චක්‍රලේඛයේ 03 ඡේදයේ 3.1 උපවගන්තිය. | පුස්තකාල පොත් වාර්ෂිකව සමීක්ෂණය කළයුතු වුවත් පුස්තකාලය ආරම්භ කල දින සිට විගණිත දිනය වන 2014 මැයි 06 දක්වා පොත් පිළිබඳව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |
| (ඈ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සඳහා කුලී පදනම යටතේ වාහන ලබාගැනීම සඳහා පැවති චක්‍රලේඛ විධිවිධාන ඉවත්කර තිබිය දී සමාලෝචිත වර්ෂය තුළ කුලී වාහනයක් වෙනුවෙන් රු.667,364 ක් ගෙවා තිබුණි. |
| (ඉ) | ජෛව රසායනික අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2003 අංක 01 දරණ නියමාවලියේ (ඈ) වගන්තිය. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව පාඨමාලාවන් ආරම්භ කළ යුතු වුවත් පාඨමාලා 04 ක් සඳහා අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන හා පුනරුත්ථාපන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.39,994,576 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂයේ ඊට අනුරූපීව රු.33,944,254 ක ඌනතාවයක් විය. පුනරාවර්තන වියදම් හා පුනරුත්ථාපන සඳහා

රු.47,818,000 ක් වූ රජයේ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,823,424 ක අතිරික්තයක් බවට පත්ව තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු.**37,568,028** ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු.**3**,623,774ක් වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රු.4,199,650 ක වර්ධනයක් ඇතිවීම සඳහා රජයේ ප්‍රදාන රු.**10,249,972** කින් **,** පර්යේෂණ ප්‍රදාන රු.**2**,445,934 කින් හා උපයන ලද ආදායම් රු.8,518,872 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණු අතර ඊට සාපේක්ෂව පුනරාවර්ථන වියදම් රු.16,903,258 කින්ද වැඩිවී තිබුණි.

**4.** මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂයේදී දර්ශනපති හා දර්ශන විශාරද හා විද්‍යාපති වශයෙන් පශ්චාත් උපාධි පාඨමාලා 05 ක් පවත්වා තිබුණි. අණුක ජෛව විද්‍යා විද්‍යාපති හා දර්ශනපති / දර්ශන විශාරද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ශිෂ්‍යයන් ලියාපදිංචිවීම 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පිළිවෙලින් සියයට 50 කින් සහ සියයට 36 කින් අඩුවී තිබුණි.

**4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා**

ආයතන ගොඩනැගිල්ල පවත්වාගෙන යන කොළඹ විශ්වවිද්‍යාලයට අයත් ඉඩම පවරා ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

**4.3 අක්‍රිය බැංකු ගිණුම්**

ආයතනය විසින් පවත්වාගෙන යන බැංකු ජංගම ගිණුම් දෙකක රු.**245,795** ක ශේෂය ඉතා දීර්ඝ කාලයක සිට ඌන උපයෝජිතව පවතින බව නිරීක්ෂණය විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 කෙටුම්පත් වාර්ෂික වාර්තා**

**2003** ජූනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

**-------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) පුස්තකාල පරිපාලනය

(ඇ) තොග පාලනය